## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA3 විභාගය - ජනවාරි 2017

## (AA32) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය
(Management Accounting and Finance)

---

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විතය. මුළු ලකුණු 100 කි,

1. **A** කොටස අනිවාර්ය ප්‍රශ්න 4 ක් ඇතුලත්ය. ලකුණු 20 කි.
2. **B** කොටස අනිවාර්ය ප්‍රශ්න 3 ක් ඇතුලත්ය. ලකුණු 30 කි.
3. **C** කොටස අනිවාර්ය ප්‍රශ්න 2 ක් ඇතුලත්ය. ලකුණු 50 කි.

**පොදු නිරීක්ෂණ:**

අයදුම්කරුවන්ගෙන් බහුතරයකගේ උත්තර ලිවීමේ සමස්ථ කාර්යසාධනය සතුටුදායක නොවිය. එහෙත් සමහර අයදුම්කරුවන් හොඳින් උත්තර ලියා ඇත.

**කොටස් අනුව කාර්යසාධනය:**

**A කොටස** සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය (දුර්වල බවක් පෙන්වූ 3 වැනි ප්‍රශ්නය හැර).

**B කොටස** සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.

**C කොටස** සඳහා සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.

---

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නයෙන් පෞද්ගලික මූල්‍ය පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. හොඳ ණයක වාසි දෙකක් ලිවීමත් අයහපත් ණයක් නිසා කෙනෙකුට ඇතිවියහැකි බලපෑම් තුනක් සඳහන් කිරීමත් අවශ්‍ය විය.

**කාර්යසාධනය:**

උත්තර ලිවීමේ සමස්ථ කාර්යසාධනය සතුටුදායකය.

**පොදු වැරදි:**

අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට ඔවුන්ගේ සාමාන්‍ය දැනුමෙන් උත්තර ලියා තිබූ බව පෙනී ගිය අතර ඒවා නියමිත ප්‍රමිතියකින් තොර විය. ප්‍රශ්නය විමසා තිබුණේ පුද්ගලික ණය පදනම් කරගෙන වුවත්, බොහෝ අයදුම්කරුවන් ඒ වෙනුවට වෙළෙඳ ණයගැතියන් ගැන සලකා උත්තර ලියා තිබුණි. සමහර අයදුම්කරුවන් අවිනිශ්චිත හා අසම්පූර්ණ උත්තර ලියා තිබුණේය. ස්ව-අධ්‍යයන පොත අධ්‍යනය කිරීමට ඔවුන් යොමු වී නොතිබුණ බව ප්‍රත්‍යක්ෂ විය.

**පරීක්ෂක යෝජනා:**

අයදුම්කරුවන් අතිරේක පොත් සහ ස්ව-අධ්‍යයන පොත්වලට යොමු වී තම දැනුම යාවත්කාලීන කරගත යුතු අතර මෙම වර්ගයේ ප්‍රශ්නවලට උත්තර ලිවීම පුරුදු පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයෙන් කාරක ප්‍රාග්ධන චක්‍රයේ දිග ගණනය කිරීම පිළිබඳව පරීක්ෂා කර ඇත.

**කාර්යසාධනය:**

උත්තර ලිවීමේ සමස්ථ කාර්යසාධනය සතුටුදායකය.

**පොදු වැරදි:**

කාරක ප්‍රාග්ධන චක්‍රයේ දිග කෙසේ ගණනය කරන්නේද යන්න පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් සමහර අයදුම්කරුවන්ට තිබුණේ නැත. වෙළෙඳ ගෙවිය යුතු දෑ පියවීමේ කාලය කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කිරීම සඳහා සමහර අයදුම්කරුවන් වැරදි ලෙස එකතුකර තිබුණි. ඔවුන්ගෙන් සමහරෙකු වෙළෙඳ ලැබිය යුතු දෑ එකතුකිරීමේ කාලය ගණනය කළ ආකාරය පෙන්වීම සඳහා පෙරවැඩ පෙන්වා තිබුණේ නැත.

**පරීක්ෂක යෝජනා:**

පසුගිය ප්‍රශ්න පත්‍ර සඳහා උත්තර ලියා පුරුද්ද ලබාගැනීම සහ ස්ව-අධ්‍යයන පොත්වලට යොමුවීම සහ වෙනත් සම්බන්ධිත දෑ අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍ය වේ. උත්තර ලිවීමේදී සැමවිටම පෙරවැඩ පෙන්විය යුතුය. සරල අංක ගණිතමය වැරදි මගහරවා ගත යුතු අතර, ගණනය කිරීම් යළි පරීක්ෂා කළ යුතුය.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයේදී තීරණ ගැනීම පිණිස ලාභ පියවීමේ වගු පිළිබඳ දැනුම පරීක්ෂාකර ඇති අතර, උපරිම ප්‍රතිපායන විසඳුම සහ අවම උපරිම විසඳුම, ප්‍රතිපායන වගුවක් උපයෝගී කර ගනිමින් හඳුනා ඇක්වීම අවශ්‍ය විය.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා උත්තර සැපයීමේ කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතුණි.

**පොදු වැරදි:**

ප්‍රතිපායන වගුවක් උපයෝගී කරගනිමින් උපරිම ප්‍රතිපායන විසඳුම සහ අවම උපරිම විසඳුම කෙසේ ගණනය කළ යුතුද යන්න පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් බොහෝ අයදුම්කරුවන්ට නොතිබූ බව නිරීක්ෂණය විය. නිවැරදි ක්‍රමය නොසලකා උත්තරය ගණනය කිරීම සඳහා නොයෙකුත් ක්‍රම බොහෝ අයදුම්කරුවන් භාවිතකර තිබුණි.

**පරීක්ෂක යෝජනා:**

ස්ව-අධ්‍යයන පොත අධ්‍යයනය කර, විෂය පිළිබඳ න්‍යායාත්මක දැනුම ලබාගෙන නොයෙක් සිද්ධිදාම යටතේ මෙම වර්ගයේ ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නයේදී පිළිගෙවුම් කාල ක්‍රමය යටතේ ව්‍යාපෘති ඇගයීම පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.

**පොදු වැරදි:**

සමහර අයදුම්කරුවන් මුදල් ප්‍රවාහ ගණනය සඳහා ක්ෂය කිරීම් ද ඇතුලත් කර තිබුණි. තවත් සමහරක් අයදුම්කරුවන් මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී සුන්බුන් වටිනාකම් සැලකිල්ලට ගෙන නොතිබුණි. සමහරු පිළිගෙවුම් කාලය ගණනය කිරීමේදී ඉතිරි මාස ගණන නොසලකා හැර, සම්පූර්ණ වර්ෂ ගණන පමණක් උත්තරවල සඳහන් කර තිබුණි.

**පරීක්ෂක යෝජනා:**

- මෙබඳු ප්‍රශ්නවලට සමාන වෙනත් පසුගිය ප්‍රශ්න පත්‍ර වල ඇති ප්‍රශ්න සඳහා උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.
- මුදල් ප්‍රවාහ සඳහා සලකා බලනු ලබන අදාල සහ අදාල නොවන අයිතම පිළිබඳ පැහැදිලි හා තීරණාත්මක දැනුම ලබා ගත යුතුය.

## B කොටස

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නයෙන් විකුණුම් මිල විචලනය හා විකුණුම් පරිමා ආන්තික විචලනය ඇතුළු විචලන විශ්ලේෂණ පිළිබඳ දැනුම පරීක්ෂාවට ලක්කර ඇත.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නොවිය.

**පොදු වැරදි:**

අයදුම්කරුවන් විකුණුම් විචලනයන් පිළිබඳව ප්‍රමාණවත් න්‍යායාත්මක දැනුමක් ලබා නොතිබුණි. බොහෝ අයදුම්කරුවන් විකුණුම් පරිමා ආන්තික විචලනය ගණනය කිරීමේ සූත්‍රය දැන සිටියේ නැත. අයදුම්කරුවන්ගෙන් බහුතරය විචලනයන් ගණනය කිරීමට අදාලව (+) / (-) ලකුණු නිවැරදිව සැලකිල්ලට ගෙන නොතිබුණි. වැරදි සූත්‍ර භාවිතය සහ වැරදි සංඛ්‍යා ආදේශ කිරීම හේතුවෙන් (b) කොටස සඳහා ලියා තිබූ උත්තර වැරදි විය.

**පරීක්ෂක යෝජනා:**

- විචලනයන් සහ සූත්‍රවලට අදාලව න්‍යායාත්මක දැනුම වර්ධනය කරගත යුතුය.
- පසුගිය ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.
- විචලනයන් ගණනය කිරීමට අදාලව වාසි, අවාසි නිවැරදිව පෙන්විය යුතු අතර (+) / (-) ලකුණු නිවැරදිව සැලකිල්ලට ගත යුතුය.
- අංක ගණිතමය සරල ගණනය කිරීම්වල වැරදි වළක්වාගත යුතුය. ගණනය කිරීම් නැවත පරීක්ෂා කර බැලිය යුතුය.

## ප්‍රශ්න අංක 06

දිගුකාලීන අරමුදල් ප්‍රභවයන්, ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීම සහ හරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නය මගින් පරීක්ෂාවට ලක්කර ඇත.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.

**පොදු වැරදි:**

අයදුම්කරුවන්ගෙන් බහුතරය ප්‍රශ්නය හරිහැටි වටහාගෙන තිබුණේ නැත. ප්‍රශ්නයේ (a) කොටසින් දිගුකාලීන ප්‍රාග්ධන ප්‍රභවයන් පිළිබඳව පරීක්ෂා කර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් බහුතරය නිසි ලෙස උත්තර සපයා තිබුණේ නැත. ප්‍රශ්නයේ (b) කොටසට අයදුම්කරුවන් සතුටුදායක උත්තර ලියා තිබුණි.

(c) කොටස සම්බන්ධයෙන් අභ්‍යන්තර ඵලදා අනුපාතිකය (IRR) ක්‍රමය වෙනුවට නොයෙකුත් අදාල නොවන සූත්‍ර භාවිත කර, නිදහස් කළ හැකි ණයකර පිරිවැය බොහෝ අයදුම්කරුවන් විසින් ගණනය කර තිබුණි.

(d) කොටස සම්බන්ධයෙන්, අයදුම්කරුවන්ගෙන් බහුතරයකට හරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කිරීම පිළිබඳව මූලික අදහසක් නොතිබූ අතර, එය ගණනය කිරීම සඳහා අදාල නොවන සූත්‍ර භාවිතකර තිබුණේය.

**පරීක්ෂක යෝජනා:**

- න්‍යායාත්මක ප්‍රශ්න සඳහා නිශ්චිත සහ අදාල නොවන උත්තර ලිවිය යුතුය.
- සමාන ප්‍රශ්න නැවත නැවතත් පරීක්ෂා කර ඇති හෙයින් පසුගිය ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.
- ස්ව-අධ්‍යයන පොත ආශ්‍රිතව මෙම ක්ෂෙත්‍රයට සම්බන්ධිත ප්‍රශ්නවලට වැඩියෙන් උත්තර ලිවිය යුතුය. ප්‍රාග්ධන ප්‍රභවයන් සහ ප්‍රාග්ධන පිරිවැය පිළිබඳ න්‍යායාත්මක කරුණු ගැන මනා දැනුමක් ලබාගත යුතුය.

## ප්‍රශ්න අංක 07

ආයෝජන ඇගයීම් පිළිබඳ දැනුම පරීක්ෂා කළ ප්‍රශ්නයකි. ඒ අනුව, මුදල් ප්‍රවාහ හඳුනාගැනීම, ශුද්ධ වර්තමාන අගය ගණනය කිරීම සහ ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව තීරණයකට එළඹීම යන කරුණු පරීක්ෂාවට ලක්වී ඇත.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ උත්තර ලිවීමේ කාර්යසාධනය දුර්වල විය.

**පොදු වැරදි:**

- සමහර අයදුම්කරුවන් බදු ගෙවීම්වලට අදාල ගණනය කිරීම් නිවැරදිව කර නැත.
- සමහර අයදුම්කරුවන් බදු ගණනය කිරීමේදී යන්ත්‍රයේ සුන්බුන් අගය සලකා බලා නැත.
- ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී කාරක ප්‍රග්ධනය යෙදවිය යුතු බව ප්‍රශ්නයේ පැහැදිලි ලෙස සඳහන් කළද, සමහර අයදුම්කරුවන් එය 1 වන වර්ෂය සඳහා හඳුනාගෙන තිබුණි.
- සමහර අයදුම්කරුවන් ශුද්ධ වර්තමාන අගය (NPV) වෙනුවට අභ්‍යන්තර ඵලදා අනුපාතිකය (IRR) ගණනය කර තිබුණි.
- අයදුම්කරුවන්ගෙන් බහුතරය (a) කොටස සඳහා ලද උත්තරය මත පදනම්ව නිර්දේශයක් සඳහන් කර තිබුණේ නැත.

**පරීක්ෂක යෝජනා:**

- සෑම විභාගයකදීම මීට සමාන වර්ගයේ ප්‍රශ්න නැවත නැවතත් පරීක්ෂාවට භාජනය කර ඇති බැවින් පසුගිය විභාගවල ප්‍රශ්න සඳහා උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුමය.
- ආයෝජන ඇගයීමේදී මුදල් ප්‍රවාහ පිටත හා ඇතුලට ගැලීම් ලකුණු පෙන්වීමේදී පරිස්සම් විය යුතුය.

<u>C කොටස</u>

## ප්‍රශ්න අංක 08

ඒකජ ප්‍රකමණ ප්‍රස්තාරික ක්‍රම භාවිතයෙන් සීමාකාරී සාධක මත පදනම්ව තීරණ ගැනීම පිළිබඳව මෙම ප්‍රශ්නය යොමු වී තිබුණි. එසේම ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රයේදී දායකය ගණනය කිරීම අවශ්‍ය විය.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.

අයදුම්කරුවන් සියලු දෙනාම වාගේ (a) කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබා ඇත. අනෙකුත් කොටස් සඳහා උත්තර සතුටුදායක නොවිය.

**පොදු වැරදි:**

- ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රය හඳුනා ගැනීම සඳහා අදාල ප්‍රස්තාරය අයදුම්කරුවන්ගෙන් බහුතරය ඇඳ තිබුණේ නැත.
- බොහෝ අයදුම්කරුවන්ට සූත්‍රය මිනිත්තුවලට පරිවර්තනය කිරීම මගහැරී තිබේ.
- ප්‍රස්තාරය ඇඳීමේදී, සමහර අයදුම්කරුවන් ඉල්ලුමේ සංරෝධක නොසළකා හැර තිබුණි.
- සමහරු ප්‍රතිශේධ නොවන සංරෝධක (non-negativity constraints) ගැන සඳහන් කර තිබුණේ නැත.
- අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබුණේ කුමක්දැයි කියවා අවබෝධ කරගෙන තිබුණේ නැත. ප්‍රශ්නය සඳහා යොදාගතයුතු ක්‍රමය කුමක්දැයි ඔවුන් හඳුනාගෙන තිබුණේ ද නැත.
- සමහර අයදුම්කරුවන් ඔවුන්ගේ උත්තරවල වඩා වැඩි, සමාන සහ අඩු සඳහා වූ ලකුණු සඳහන් කර නොතිබුණි.
- ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ප්‍රස්තාරයේ ශක්‍යතා ප්‍රදේශය (feasibility area) ලකුණු කර තිබුණේ නැත.

**පරීක්ෂක යෝජනා:**

- අයදුම්කරුවන් විසින් නිසි අවබෝධයෙන් යුතුව වඩා වැඩි, වඩා අඩු, සමාන යන ලකුණු යෙදීම කළ යුතුය.
- අදාල විෂය කරුණු අයදුම්කරුවන් විසින් මැනවින් අධ්‍යයනය කළ යුතු අතර, සමාන ප්‍රශ්නවලට උත්තර ලියා පුරුදු පුහුණු විය යුතුය.
- මෙබඳු ප්‍රශ්නවලදී ඒකජ ප්‍රකමණයෙහි සියලුම පියවර අයදුම්කරුවන් විසින් පෙන්විය යුතුය.

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නයේ A කොටසින් නම්‍ය අයවැය මත පදනම්ව අයවැය පාලන ප්‍රකාශනයක් පිළියෙල කරගන්නේ කෙසේද යන්නත්, ඊට අදාල න්‍යායාත්මක දැනුමත් පරීක්ෂාවට ලක්කර තිබේ. එමෙන්ම අයවැය පාලන පද්ධතියක අරමුණු පිළිබඳවද විමසා ඇත. B කොටසින් විචලනයන් ගණනය කිරීමේ දැනුම සහ මෙහෙයුම් ප්‍රකාශන පිළියෙල කිරීම සහ සැසඳීමේ හැකියාව පරීක්ෂාවට ලක්කර තිබේ.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.

**පොදු වැරදි:**

**A කොටස (a) -** අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙහෙයුම් ප්‍රකාශනය ක්‍රමානුකූල අන්දමට පිළියෙල කර තිබුණේ නැත. බොහෝ අයදුම්කරුවන් නම්‍ය අයවැය පිළියෙල කර නොතිබූ අතර, දෙනලද මුදල් අයවැය සහ සත්‍ය අයවැය මත පදනම්ව විචලනයන් ගණනය කර ඇත.

සමහර අයදුම්කරුවන්ට ගණනය කරන ලද විචලනයන් වාසිදායකද, නැතහොත් අවාසිදායකදැයි හඳුනා ගැනීමටද ඒ බැව් සඳහන් කිරීමටද නොහැකි වී ඇත.

**A කොටස (b) -** අයදුම්කරුවන්ගෙන් කිහිප දෙනෙකුට පමණක් නිවැරදි ලෙස අයවැය පාලනයේ අරමුණු හඳුනාගෙන පැහැදිලි කිරීමට හැකි වී ඇත. අයදුම්කරුවන්ගෙන් සමහරක් අරමුණු හඳුනාගෙන තිබුණා මිස එම හඳුනාගත් අරමුණු පැහැදිලි කිරීම ප්‍රශ්නයේ පැහැදිලිව දක්වා තිබුණද එය සිදුකර තිබුණේ නැත.

**B කොටස (a) සහ (b) -** බොහෝ අයදුම්කරුවන් සූත්‍රය ලියා තිබූ නමුත් සංඛ්‍යා නිවැරදිව යොදාගෙන නැත. සමහර අයදුම්කරුවන් සම්මත සූත්‍ර භාවිත කරනවා වෙනුවට වැරදි ක්‍රම භාවිත කරමින් විචලනයන් ගණනය කිරීමට උත්සාහා කර ඇත. එමනිසා, උත්තර බොහොමයක් වැරදි තිබුණි. අයදුම්කරුවන් කිහිප දෙනෙකු "අවාසි" සහ "වාසි" ලකුණු වැරදි ආකාරයට යොදා තිබීම හේතුවෙන් ලකුණු අහිමි කරගෙන තිබුණි.

**B කොටස (c) -** සමහර අයදුම්කරුවන් විචලනයන්, වාසි සහ අවාසි තීරු යටතේ දී තිබුණද සත්‍ය දායකය සහ සංශෝධිත අයවැයගත දායකය ගණනය කිරීමකින් තොරව එලෙසම සඳහන් කර තිබුණි.

සමහර අයදුම්කරුවන් හට රු.207,000/- ක ආදායම් විචලනය මෙහෙයුම් ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගැනීමට අමතක වී ඇත.

**පරීක්ෂක යෝජනා:**

- විවිධ සිද්ධිදාම යටතේ විචලනයන් ගණනය කිරීමට අදාල සූත්‍ර භාවිතය ගැන අයදුම්කරුවන් පුරුදු පුහුණු විය යුතුය.
- අයදුම්කරුවන් සියලුම පෙරවැඩ පෙන්විය යුතුය.
- විචලන විශ්ලේෂණවලදී සංඛ්‍යා නිවැරදිව යොදා සූත්‍ර ඉදිරිපත් කිරීම වැදගත්ය.
- මෙම ක්ෂේත්‍ර පිළිබඳව විශ්වාසය තහවුරුවීම සඳහා ස්ව-අධ්‍යයන පොත අනුගමනය කර විවිධ වර්ගයේ ප්‍රශ්නවලට උත්තර ලිවීම පුරුදු පුහුණු විය යුතුය.
- උත්තර ලිවීමේදී ක්‍රමානුකූල අන්දමට ඉදිරිපත් කිරීම් කළ යුතුය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු</u>:**

1. නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.
3. ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.
4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරීක්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.
7. ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.
8. මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.
9. විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මගින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.
10. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -